ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

<u>**ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත පිරිසේ ඉන්දීය සංචාරය**</u>

කතානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ප්‍රමුඛ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් 2023 දෙසැම්බර් 16 - 20 දිනවල ඉන්දියාවේ සංචාරයක නිරත විය. පරිසර අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා, විවිධ පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 9 දෙනෙකු සහ මහ ලේකම් ඇතුළු නිලධාරින් මෙම නියෝජිත පිරිසට ඇතුළත් විය. නව දිල්ලියේ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල විවෘත කිරීමෙන් පසු ඉන්දියාවට පැමිණි පළමු විදේශ පාර්ලිමේන්තු නියෝජිත පිරිස වන්නේ මෙම ශ්‍රී ලංකා නියෝජිත පිරිසයි.

2. කතානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ප්‍රමුඛ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නියෝජිත පිරිසක් 2023 දෙසැම්බර් 16 - 20 දිනවල ඉන්දියාවේ සංචාරයක නිරත විය. පරිසර අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා, විවිධ පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 9 දෙනෙකු සහ මහ ලේකම් ඇතුළු නිලධාරින් මෙම නියෝජිත පිරිසට ඇතුළත් විය. නව දිල්ලියේ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල විවෘත කිරීමෙන් පසු ඉන්දියාවට පැමිණි පළමු විදේශ පාර්ලිමේන්තු නියෝජිත පිරිස වන්නේ මෙම ශ්‍රී ලංකා නියෝජිත පිරිසයි.

3. කතානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා ඇතුළු ශ්‍රී ලංකාවෙන් පැමිණි අනෙකුත් සම්භාවනීය නියෝජිතයෝ 2022 වසරේදී ශ්‍රී ලංකා ජනතාව වෙනුවෙන් ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 4ක පෙර නොවූවිරූ සහයෝගය සම්බන්ධයෙන් ඉන්දීය රජයට ස්තූතිය පළ කළහ. වෙළඳ සහ සංචාරක කර්මාන්තය ඇතුළු විවිධ ක්ෂේත්‍ර රැසක් සඳහා ඉන්දියාවෙන් වඩා සමීප සහ ශක්තිමත් සහයෝගීතාවයක් අපේක්ෂා කරන බව ද ඔවුහු පැවසූහ. දෙරට අතර පවතින ශිෂ්ටාචාරමය බැඳීම් අවධාරණය කරමින් ඉන්දීය නායකත්වය ප්‍රකාශ කළේ සම්බන්ධකතාවය, පුනර්ජනනීය බලශක්තිය සහ ආයෝජන ඇතුළු විවිධ ක්ෂේත්‍ර සඳහා තවදුරටත් ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දෙන බවයි. දෙරට පාර්ලිමේන්තු අතර වඩා නිරන්තර හුවමාරු පැවැත්විය යුතු බව ද දෙපාර්ශවය ප්‍රකාශ කළහ.

4. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ශක්තිමත් බෞද්ධ සබඳතා අවධාරණය කරමින් නියෝජිත පිරිස ලෝක උරුමයක් වන අජන්තා ලෙන් හි සංචාරයක නිරත වූහ. එසේම, නියෝජිත පිරිස ඇසෑම් ප්‍රාන්තයේ ද සංචාරයක නිරත වූ අතර එහිදී ඇසෑම් හි කතානායක ශ්‍රී බිස්වජිත් ඩෙයිමරි මහතා සහ ප්‍රාන්ත රජයේ සාමාජිකයන් රැසක් ද හමු වූහ. ඔවුහු මෑතකදී විවෘත කරන ලද සභා පරිශ්‍රය ද  දැක බලා ගත්හ.

5. 2021 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ නැවත ස්ථාපනය කරන ලද ඉන්දියා - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 100කට අධික පිරිසක් සහභාගී වූ බව මෙහිදී සිහිපත් කළ යුතුය. 2023 අගෝස්තු මාසයේදී විදේශ

කටයුතු අමාත්‍යතුමාගේ වීඩියෝ පණිවිඩය සඳහා ද 2023 දෙසැම්බර් මස පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සඳහා පැවති ප්‍රිය සම්භාෂණය සඳහා ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරු රැසක් සහභාගී වූහ. මෙම සංචාරය මෙන්ම ඉහත වැඩසටහන් සඳහා ඉහළ සහභාගිත්වය දෙරට ජනතාව බැඳ තබන ප්‍රජාතාන්ත්‍රික වටිනාකම් සහ සම්ප්‍රදායන් සංකේතවත් කරයි.

***

කොළඹ
2023 දෙසැම්බර් 22